# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

**ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව - 2023**

**1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතේ 3, iii, (ආ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය පාලක සභාව විසින් සම්පාදනය කරන ලද අතුරු ව්‍යවස්ථාව**

**2023 මාර්තු මස 28 දින සිට වලංගු වේ.**

# ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව - 2023

**1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතේ 3, iii, (ආ) වගන්තිය ප්‍රකාරව ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ සියලුම ගිහි පිරිමි ශිෂ්‍යයන් අතර ආචාර ධර්මානුකූල පැවැත්ම හා මානසික ශික්ෂණය පවත්වා ගෙන යාම සහ ඒවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම යටතේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය පාලක සභාව පනතේ 17, (2), (x) වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා, රීති සහ නියෝග සෑදීමට බලය දී ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා, රීති සහ නියෝග සෑදීම ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කොට ඇත.**

01. මෙම අතුරු ව්‍යවස්ථාව ''ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව - 2023'' යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2023 මාර්තු මස 28 දින සිට ක්‍රියාත්මක විය යුතුය. මීට පෙර ශිෂ්‍යයන් වෙත නිකුත් කර ඇති සියලු අතුරු ව්‍යවස්ථා හෝ රෙගුලාසි මෙම අතුරු ව්‍යවස්ථාව මගින් ආදේශ වනු ඇත.

02. මෙම අතුරු ව්‍යස්ථාවෙහි විධිවිධාන අතුරින් කිසියම් විධානයකට පටහැනිව කුමක් සඳහන් වුව ද විශ්වවිද්‍යාලයේ විනය පවත්වාගෙන යාම සඳහා මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් අවශ්‍ය යැයි සලකනු ලබන කවර හෝ උචිත පියවරක් ගැනීම කළ හැකි වන අතර 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතට හෝ වෙනත් යම් සාධන පත්‍රයකට පටහැනි නොවන ආකාරයකට ක්‍රියා කිරීම මහෝපාධ්‍යායයන් වහන්සේ සතු කාර්යය කි. මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් එලෙස ගනු ලබන යම් ක්‍රියාමාර්ගයක් වේ නම් ඒ බව නොපමාව පාලක සභාව වෙත වාර්තා කළ යුතුය.

03. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ලියාපදිංචිය ලබන සෑම ශිෂ්‍යයෙකුට ම මෙම අතුරු ව්‍යවස්ථාව අදාළ වේ.

04. (1) මේ අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම මත 2වන අනුඡේදයේ විධිවිධාන සලසා ඇති පරිදි විනය මණ්ඩලය ස්ථාපනය කළ යුතුය.

(2) විනය මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

I. එක් එක් පීඨයේ පීඨාධිපති
II. විනයාධිකාරී
III. ශාලාධිපති
IV. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක
V. පාලක සභාවට පත්කරන ලද සාමාජිකයින් අතුරින් පත්කරන ලද දෙදෙනෙකු
VI. ලේඛකාධිකාරී හෝ ඔහුගේ නාමිකයා (ලේකම්)

**(3) විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වාගෙන යාම සඳහා විනය මණ්ඩල සාමාජිකත්වය**

i. ඉහත අංක I සිට V දක්වා පත් වූ සාමාජිකයින් පත් වූ දින සිට වසර තුනක් හෝ විනය මණ්ඩලයේ සාමාජිකත්වයට පත්වීමට පදනම් වූ තනතුරු දරන තෙක් සාමාජිකත්වය දරනු ඇත.

ii. විනයාධිකාරී විනය මණ්ඩලයේ සභාපති විය යුතු අතර ඔහු එම මණ්ඩලයේ රැස්වීම්වල මුලසුන දැරිය යුතුය. ඔහුට රැස්වීමට පැමිණිය නොහැකි නම් හෝ මුලසුන දැරිය නොහැකි අවස්ථාවක දී සාමාජිකයින් විසින් එම රැස්වීමට පැමිණ සිටි අය අතුරින් කෙනෙකු තාවකාලික සභාපති වශයෙන් පත්කර ගත යුතු වන්නේ ය.

iii. විනයාධිකාරී, ශාලාධිපති සහ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක නිලකාලය අවසන් වූ පසු නැවත පත්කිරීමට සුදුස්සන් වේ.

iv. විනය මණ්ඩලයේ ගණ පූර්ණය පස් දෙනෙකු විය යුතුය.

v. විනය මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය සහ ක්‍රියා පිළිවෙළ එම මණ්ඩලය විසින් කලින් කල තීරණය කළ යුතුය.

vi. ලේඛකාධිකාරී හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තෙකු නිල බලයෙන් විනය මණ්ඩලයේ ලේකම්වරයා වන්නේ ය.

**(4) විනය මණ්ඩලය සතු බලතල හා වගකීම්**

i. විශ්වවිද්‍යාලයෙහි ශිෂ්‍ය විනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යැයි හැඟෙන පියවර හා ක්‍රියාමාර්ග පිළිබඳ ව මහෝපාධ්‍යායයන් වහන්සේට නිර්දේශ කිරීම.

ii. විශ්වවිද්‍යාලයෙහි ශිෂ්‍ය විනයට අදාළ නීතිරීති සම්පාදනය කිරීම පිළිබඳ ව පාලක සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම.

iii. විශ්වවිද්‍යාලයෙහි යම් ශිෂ්‍යයෙකුගේ විනය විරෝධී හැසිරීම් හෝ විෂමාචාර ක්‍රියා පිළිබඳ ව උචිත පරීක්ෂණ පැවැත්වීම හෝ පරීක්ෂණ පැවැත්වීමට සැලැස්වීම හා පරීක්ෂණවලින් පසුව එළඹෙන නිගමන හා නිර්දේශ මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත ඉදිරිපත් කිරීම.

iv. විනය මණ්ඩලය විසින් හෝ එම මණ්ඩලය විසින් පත්කරන ලද කමිටුවක් විසින් හෝ පවත්වන යම් පරීක්ෂණයක් ඉදිරියට යම්කිසි ශිෂ්‍යයෙකු හෝ මහෝපාධ්‍යායයන් වහන්සේගේ අනුමැතිය ඇති ව අධ්‍යයන / අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු හෝ වෙනත් සේවකයෙකු හෝ කැඳවීමේ හා ඒ අයගෙන් වාචික හා ලිඛිත සාක්ෂි ලබාගැනීමේ බලය.

v. විනය මණ්ඩලය විසින් හෝ එම මණ්ඩලය මගින් රැස්කරන ලද කමිටුවක් විසින් හෝ පවත්වන පරීක්ෂණයක දී සිය කැමැත්තෙන් සාක්ෂි දීමට ඉදිරිපත් වන හෝ ඉල්ලීමක් කළ අයෙකු වුව ද පරීක්ෂණයකට අදාළ වැදගත් තොරතුරු ලබා ගත හැකියැයි විනය මණ්ඩලයට හැඟෙත හොත් ඒ අය සාක්ෂි දීමට කැඳවීමේ බලය.

vi. විශ්වවිද්‍යාලයෙහි විනය හා සාමය ආරක්ෂා කිරීම සඳහා හෝ විනය පරීක්ෂණ පවත්වා අවසාන වන තෙක් හෝ යම් ශිෂ්‍යයෙකුට පංතිවලට සහභාගීවීම හෝ විශ්වවිද්‍යාල භූමියට ඇතුලුවීම හෝ තහනම් කිරීම නිර්දේශ කිරීමේ බලය.

vii. ශිෂ්‍යයන් විසින් විනය කඩකිරීම් පිළිබඳව ශිෂ්‍යයන්ට එරෙහි ව විනය මණ්ඩලයට ලැබෙන පැමිණිලි පරීක්ෂා කිරීමට විනය කමිටු පත්කිරීමේ බලය ඇත. සිදු වී ඇති විනය විරෝධී ක්‍රියාවේ බරපතළකම අනුව විනය කමිටුවේ සාමාජික සංඛ්‍යාව තීරණය කළ යුතු අතර උපරිම සාමාජික සංඛ්‍යාව තුනකි. එහි සාමාජිකයින් අතුරින් එක් අයෙකු විනය මණ්ඩලයේ සාමාජිකයෙකු විය යුතු අතර එම තැනැත්තා කමිටුවේ සභාපති විය යුතුය.

**(5) විනයාධිකාරී සතු බලතල හා වගකීම්**

i. විශ්වවිද්‍යාලය තුළ ශිෂ්‍ය විනය සම්බන්ධ කටයුතු සඳහා මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් බලය පවරනු ලැබේ.

ii. විශ්විද්‍යාලයීය පනත ප්‍රකාරව හා විශ්වවිද්‍යාලයට අදාළ විය හැකි වෙනත් සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව විශ්වවිද්‍යාලයේ සිසුන් අතර විනය පවත්වාගෙන යාම භාරව කටයුතු කළ යුතුය.

iii. විනය පාලකවරයා ඔහුගේ රාජකාරී ඉටුකිරීමේ දී මහෝපාධ්‍යායයන් වහන්සේගේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.

iv. විශ්වවිද්‍යාලයේ විනය කඩ කිරීම් සම්බන්ධයෙන් මූලික විමර්ශන විනය පාලකවරයා විසින් පවත්වා මහෝපාධ්‍යායයන් වහන්සේගේ උපදෙස් පරිදි සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

v. විනය කඩ කිරීම් පිළිබඳ සිද්ධිය පහත සඳහන් දඬුවම්වලින් එකක් පැනවීම මගින් ප්‍රමාණවත් ලෙස විසඳිය හැකි ස්වභාවයේ එකක් වන විට දී විනය පාලකවරයා විසින්ම ක්‍රියාමාර්ගයක් ගැනීම ඔහුට කළ හැකිය.

(අ) සති හතරක් නොඉක්මවන කාල පරිච්ඡේදයක් සඳහා විශ්වවිද්‍යාලයට පැමිණීම අත්හිටුවීම

(ආ) ලිඛිත අවවාද කිරීමක්

vi. මෙම විධිවිධාන යටතේ විනය පාලකවරයා ක්‍රියාකරන සෑම අවස්ථාවකම ඒ සම්බන්ධයෙන් වාර්තාවක් මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත ඉදිරිපත් කොට අවශ්‍ය උපදෙස් ලබාගත යුතුය.

vii. විනය පාලකවරයා විසින් පවත්වන ලද විමර්ශනයකින් අනාවරණය වන සිද්ධීන් ඉහත සඳහන් දඬුවම් ලබාදීමෙන් විසඳිය හැකි නොවන බරපතල ඒවා බවට හෙලිවුවහොත් විනය පාලකවරයා විසින් විමර්ශනයක් පවත්වා උචිත ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා ඔහුගේ සොයා ගැනීම් සහ නිර්දේශ මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත ඉදිරිපත් කළ යුතුය.

viii. විෂමාචාර ක්‍රියාවකට සම්බන්ධ වූ කිසියම් ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ රැඳී සිටීමට අවසර දීමෙන් විශ්වවිද්‍යාලයේ සුමට ක්‍රියාකාරීත්වයට හෝ සුහදශීලි වාතාවරණයට හෝ විමර්ශන පැවැත්වීමට අහිතකරවනු ඇතැයි විනය පාලකවරයාගේ අදහස වන්නේ නම්, මූලික විමර්ශන හා / හෝ විධිමත් පරීක්ෂණ පැවැත්වීමට යටත්ව මහෝපාධ්‍යායයන් වහන්සේගේ එකඟතාව ඇතිව එම ශිෂ්‍යයා හෝ ශිෂයයන් විශ්වවිද්‍යාල පරිශ්‍රයට පැමිණීම අත්හිටුවීමට විනය පාලකවරයාට හැකිය. මෙම

විධිවිධාන යටතේ විනය පාලකවරයා ක්‍රියාකරන සෑම අවස්ථාවකම ඔහු මහෝපාධ්‍යායයන් වහන්සේට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

ix. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය විනය මැනවින් පවත්වාගෙන යාම සඳහා සියලු විධිවිධාන සැලසීම.

x. විශ්වවිද්‍යාලයේ සිසුන් අතර නොසන්සුන්තාවයක් ඇති වූ විට ඒ ගැන වහා ම සොයා බලා එම තත්වය මැඩ පැවැත්වීමට ක්‍රියා කිරීම.

xi. අනවසරයෙන් ශිෂ්‍ය කණ්ඩායම් එකතු වී රැස්වීම් පැවැත්වීමට සැරසෙන බවට තොරතුරු ලැබුණු වහාම ඒ ගැන පරීක්ෂා කොට එම කණ්ඩායම් විසුරුවා හැරීම. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක සමග සම්බන්ධ වී මේ ගැන ක්‍රියාකළ යුතු ආකාරය සාකච්ඡා කිරීම.

xii. ශිෂ්‍ය විනය කඩකිරීම් සම්බන්ධයෙන් වාර්තා වූ විට ඊට සම්බන්ධ ශිෂ්‍යයන්ගේ අනන්‍යතාව පරීක්ෂා කිරීමෙන් පසු ව අවශ්‍ය වන පරිදි වාචික හා ලිඛිත ප්‍රකාශ ලබා ගනිමින් මූලික පරීක්ෂණ පැවැත්වීම හා එම සිද්ධීන් ගැන පූර්ණ වාර්තාවක් මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත වාර්තා කිරීම.

xiii. ශිෂ්‍ය විනය සම්බන්ධයෙන් මහෝපාධ්‍යායයන් වහන්සේ / විනය මණ්ඩලය මගින් අවස්ථාවෝචිත පරිදි පැවරෙන අමතර රාජකාරී ඉටුකිරීම.

**(6) ශාලාධිපති සතු බලතල හා වගකීම්**

i. සියලු ගිහි-පැවිදි නේවාසික සිසුන්ගේ විනය මැනවින් පවත්වාගෙන යාම හා ඒ පිළිබඳ අධීක්‍ෂණය.

ii. ගිහි පැවිදි නේවාසික සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳ පූර්ණ අධීක්‍ෂණය හා අවශ්‍යතාවය මත සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.

iii. ශිෂ්‍ය සුභසාධන ගැටළු සොයා බැලීම හා විසඳුම් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

iv. නේවාසික ගිහි-පැවිදි සිසුන්ගේ අධ්‍යයන නිදහස තහවුරු කිරීම හා නේවාසික පරිශ්‍රය තුළ සාමකාමී පරිසරයක් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

v. නේවාසිකාගාර සම්පත් අවභාවිතය වැළැක්වීමට පියවර ගැනීම හා ගිහි-පැවිදි සිසුන් නේවාසිකාගාර සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කරන ආකාරය පිළිබඳ අධීක්ෂණය.

vi. නේවාසිකාගාර සම්පත් අවභාවිත කරන්නන්ට හා ඒවාට හානි කරන්නන්ට එරෙහි ව නේවාසිකාගාර උපපාලක (පූර්ණකාලීන) විසින් අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇති බව තහවුරු කරගැනීම.

vii. ආපනශාලා පවත්වාගෙන යාමට මැදිහත්වීම හා ඒ හා සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම.

viii. ගිහි-පැවිදි සිසුන් අතර ගැටුම් ඇතිවීම වැළැක්වීම හා ගැටුම් කළමනාකරණය කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

ix. නේවාසික ගිහි-පැවිදි සිසුන් තුළ ශාසනික හා ආගමික ආකල්ප ප්‍රවර්ධනය කිරීමට මැදිහත්වීම.

x. නේවාසිකාගාර උපපාලකවරුන් මගින් නේවාසික ගිහි-පැවිදි සිසුන්ගේ පොදු හා පුද්ගලික ගැටළු පිළිබඳ සොයා බැලීම හා විසඳුම් ලබාදීම.

xi. නේවාසිකාගාර උපපාලකවරුන්ගේ (අධ්‍යයන) වගකීම් හා කාර්යභාරය අධීක්‍ෂණය හා නියාමනය.

xii. නේවාසිකාගාර උපපාලකවරුන්ගේ (පූර්ණකාලීන) වගකීම් හා කාර්යභාරය අධීක්‍ෂණය හා නියාමනය.

xiii. ශිෂ්‍ය අත්පොතෙහි සඳහන් 6.1 වගන්ති ප්‍රකාරව කටයුතු සිදුවන බව අධීක්‍ෂණය නියාමනය හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

xiv. නේවාසිකාගාර උපපාලකවරු සමඟ අවම වශයෙන් මසකට වරක් සාකච්ඡාවක් පැවැත්වීම හා එසේ හඳුනාගනු ලබන ගැටලු නිරාකරණය කිරීමට පියවර ගැනීම.

xv. නේවාසිකයින් පොදු සම්පත් අවභාවිත කිරීම හා ඒවාට හානි කිරීම්වලින් වැළැක්වීම එමෙන්ම අවභාවිත කරන්නන්ට හා හානි කරන්නන්ට එරෙහිව අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇති බව තහවුරු කරගැනීම.

xvi. නේවාසික පරිශ්‍රය ආශ්‍රිතව රාජකාරී කටයුතුවල නියැලෙන ආරක්‍ෂක අංශය අධීක්‍ෂණය හා නියාමනය.

xvii. නේවාසික ගිහි පැවිදි සිසුන්ගේ පැමිණීම් පිටවීම් සම්බන්ධයෙන් නේවාසිකාගාර උපපාලක (අධ්‍යයන), උපපාලක (පූර්ණකාලීන) හා ආරක්‍ෂක අංශය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා අධීක්‍ෂණය හා නියාමනය.

xviii. අනේවාසික ගිහි-පැවිදි පිරිස් පැමිණීම්, රැඳී සිටීම් හා වෙනත් ක්‍රියාකාරකම්වලට සම්බන්ධවීම් පිළිබඳ ව නේවාසිකාගාර උපපාලක (අධ්‍යයන), උපපාලක (පූර්ණකාලීන) හා ආරක්‍ෂක අංශය විසින් සිදු කෙරෙන කාර්යයන් අධීක්‍ෂණය හා නියාමනය.

xix. නේවාසිකයින් අතර හෝ නේවාසික පරිශ්‍රය තුළ ඇතිවන යම් විශේෂ තත්ත්වයන් සලකා බලා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

xx. ඉහත කාර්යයන්ට අමතර ව මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් වරින්වර පවරනු ලබන වෙනත් වගකීම් හා කාර්යයන් ඉටු කිරීම.

**(7) ජ්‍යෝෂ්ඨ ශිෂ්‍ය උපදේශක සතු බලතල හා වගකීම්**

i. ශිෂ්‍ය අත්පොතේ 6.1 ප්‍රකාරව නිසි පරිදි කටයුතු සිදුවන්නේදැයි අධීක්ෂණය කිරීම.

ii. විශ්වවිද්‍යාලය තුළ සිසුන්ගේ අධ්‍යයන කටයුතු මැනවින් සිදුකරගෙන යාමට පාලන අධිකාරියට සහාය වීම.

iii. නේවාසිකාගාර පරිශ්‍රය තුළ ගිහි-පැවිදි සිසුන් අතර ගැටුම් ඇතිවීම වැළැක්වීම හා එසේ ගැටුම් ඇතිවන අවස්ථාවලදී අදාළ බලධාරීන් වෙත වාර්තා කිරීම.

iv. ගිහි-පැවිදි සිසුන් තුළ ශාසනික හා ආගමික ආකල්ප ප්‍රවර්ධනය කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.

v. ගිහි-පැවිදි සිසුන්ගේ පොදු හා පුද්ගලික ගැටලු පිළිබඳ සොයා බැලීම හා විසඳුම් ලබාදීම.

vi. ශිෂ්‍ය උපදේශකවරුන්ගේ කාර්ය හා කර්තව්‍යය අධීක්ෂණය කිරීම.

vii. ශිෂ්‍ය විනය හා ශිෂ්‍ය ගැටලු පිළිබඳ ශිෂ්‍ය උපදේශකවරුන් සමඟ අවම වශයෙන් මසකට වරක් හෝ සාකච්ඡා කිරීම හා ඉදිරිපත් වන ගැටලු නිරාකරණය සඳහා ශාලාධිපති ඇතුළු ජ්‍යෝෂ්ඨ නිලධාරීන් දැනුම්වත් කිරීම.

viii. ශිෂ්‍ය උපදේශකවරුන් විසින් යොමු කරනු ලබන පැමිණිලි ආදිය පිළිබඳ සුදුසු නිර්දේශ මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත ඉදිරිපත් කිරීම.

ix. මීට අමතර ව විනය පාලක සහ ශාලාධිපති විසින් පවරනු ලබන වෙනත් කාර්යයන් නිසි ලෙස ඉටුකිරීම.

**(8) නේවාසිකාගාර උපපාලක (අධ්‍යයන) සතු බලතල හා වගකීම්**

i. (අ) සියලු පැවිදි සිසුන් කෙස් රැවුල් කපා ඇත්දැයි සති දෙකකට වරක් සොයා බැලීම. (ආ) සියලු ගිහි සිසුන් විශ්වවිද්‍යාලයට යෝග්‍ය වන සේ කොණ්ඩය සහ රැවුල කපා සිටීදැයි සොයා බැලීම හා කරාබු ආදී සංකර දෑ පැළඳීමෙන් වැළැක්වීම.

ii. නේවාසිකාගාර පහසුකම් ලබා සිටින සියලු ගිහි-පැවිදි සිසුන් දිනපතා දේශනවලට සහභාගී වන්නේදැයි සොයා බැලීම.

iii. නේවාසිකාගාර පහසුකම් ලබා සිටින සියලු ගිහි-පැවිදි සිසුන් සති දෙකකට වරක් තමන්ව මුණ ගැසිය යුතු බවට සිසුන් දැනුම්වත් කිරීම සහ එම සිසුන් කණ්ඩායම් වශයෙන් මුණගැසීම.

iv. ශාලාධිපති සහ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක ස්වාමීන් වහන්සේලා වෙත පිටපත් සහිතව මසකට වරක් ශිෂ්‍ය විනය හා චර්යාවන් පිළිබඳව මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත වාර්තා කිරීම.

v. මසකට හෝ අඩ මසකට වරක් පැවැත්වෙන ශාලා සංගම් රැස්වීම් (Hostel Societies) සඳහා සිසුන් සහභාගී කරවීම හා අවශ්‍ය කටයුතු සඳහා මැදිහත් වීම.

vi. නේවාසිකාගාර පහසුකම් ලබා සිටින සියලු ගිහි-පැවිදි සිසුන්ගේ සුභසාධන ගැටලු පිළිබඳ සොයා බලා ඒ සම්බන්ධයෙන් ශාලාධිපති දැනුම්වත් කිරීම.

vii. දිනකට අවම වශයෙන් එක් වරක්වත් නේවාසිකාගාරවලට අයත් මහල්වල නිරීක්ෂණ චාරිකාවක (Ward round) නිරත වීම (මෙහි දී කිසි විටෙකත් තනිව නොයා යුතු අතර හැමවිටම වෙනත් නේවාසිකාගාර උප පාලකවරයෙකු (අධ්‍යයන) හෝ පූර්ණ කාලීන නේවාසිකාගාර උප පාලකවරයෙකු සමඟ යාම හා ඒ පිළිබඳ වාර්තා තබා ගැනීම).

viii. සමස්ත විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ නේවාසිකාගාර පරිශ්‍රය තුළ කිසියම් විනය විරෝධී ක්‍රියාවක් සිදු කිරීමක්, ඊට අනුබල දීමක්, මෙහෙයවීමක් හෝ සැලසුම් කිරීමක් සඳහා කිසියම් ශිෂ්‍යයෙකු හෝ කණ්ඩායමක් සූදානම් වන හෝ සැලසුම් කරන අවස්ථාවක දී ඒ බව අදාළ ශිෂ්‍යයන්ගේ විස්තර සහිතව ශාලාධිපති සහ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක ස්වාමීන් වහන්සේලා මගින් මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත දන්වා සිටීම.

**(9) ශිෂ්‍ය උපදේශක සතු බලතල හා වගකීම්**

i. ගිහි-පැවිදි සියලු සිසුන්ගේ විෂයානුබද්ධ අධ්‍යයන ගැටලු පිළිබඳ සොයා බලා අදාළ අංශ හෝ වගකීම් දරන්නන් වෙත යොමු කොට විසඳුම් ලබාදීමට මැදිහත්වීම.

ii. ගිහි-පැවිදි සියලු සිසුන් දිනපතා දේශනවලට සහභාගී වන්නේදැයි සොයා බලා අවශ්‍ය උපදෙස් ලබාදීම.

iii. ගිහි-පැවිදි සියලු සිසුන් පුස්තකාලය පරිශීලනය කිරීම කෙරෙහි උනන්දු කරවීම.

iv. ගිහි-පැවිදි සියලු සිසුන්ට පෞද්ගලික ගැටලු තිබේදැයි සොයා බැලීම හා හඳුනාගත් ගැටලු අදාළ අංශ හෝ වගකීම් දරන්නන් වෙත යොමු කොට විසඳුම් ලබා දීමට මැදිහත්වීම.

v. ගිහි-පැවිදි සියලු සිසුන්ගේ අධ්‍යයන හා සුහසාධන ගැටලු පිළිබඳ සොයා බලා ඒ පිළිබඳ ව ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක ස්වාමීන් වහන්සේ දැනුම්වත් කිරීම.

vi. (අ) සියලු පැවිදි සිසුන් තුළ ශාසනික කටයුතු පිළිබඳ උනන්දුවක් ඇති කිරීම හා ධර්මධර, විනයධර භික්ෂුවක් බවට පත්වීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.
(ආ) සියලු ගිහි සිසුන් ආගමික කටයුතු කෙරෙහි උනන්දු කරවීම හා මනා හික්මීමක් සහිත පුද්ගලයෙකු බවට පත්වීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

vii. ශිෂ්‍ය අත්පොතේ 6.1 හි සඳහන් විනය රෙගුලාසි ප්‍රකාරව සිසුන්ගේ විනය පවත්වාගෙන යාමට හා සිසුන් විනය විරෝධී ක්‍රියාවලින් වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම.

viii. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක මගින් මසකට වරක් ශිෂ්‍ය විනය හා චර්යාවන් පිළිබඳව මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත වාර්තා කිරීම.

ix. විශ්වවිද්‍යාල භූමියට අයත් ස්වාභාවික පරිසරයට (තෘණ භූමි ඇතුළත්ව) හානි නොවන අයුරින් කටයුතු කිරීමට සිසුන්ට උපදෙස් ලබා දීම.

x. විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ නේවාසික පරිශ්‍රය තුළ කිසියම් විනය විරෝධී ක්‍රියාවක් සිදු කිරීමක්, ඊට අනුබල දීමක්, මෙහෙයවීමක් හෝ සැලසුම් කිරීමක් සඳහා කිසියම් ශිෂ්‍යයෙකු හෝ කණ්ඩායමක් සූදානම් වන හෝ සැලසුම් කරන අවස්ථාවක දී ඒ බව අදාළ ශිෂ්‍යයන්ගේ විස්තර සහිතව ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක ස්වාමීන් වහන්සේ වෙත කරුණු වාර්තා කොට අවශ්‍ය පියවර ගැනීම.

**(10) විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වාගෙන යාම සඳහා විනයාධිකාරී හැරුණු විට පහත සඳහන් ආචාර්යවරු සහ නිලධාරීහු බලධාරීහු වෙති.**

I. පීඨාධිපතිවරු
II. පුස්තකාලයාධිකාරී
III. අධ්‍යයනාංශාධිපතිවරු
IV. ශාලාධිපති
V. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක
VI. ශිෂ්‍ය උපදේශකවරු
VII. සියලුම ආචාර්යවරු
VIII. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
IX. නේවාසිකාගාර උපපාලකවරු (අධ්‍යයන/පූර්ණකාලීන)
X. ආරක්ෂක නිලධාරීන්

(අ) ආචාර්යවරුන් සහ නිලධාරීන් සතු බලතල සහ වගකීම්

i. කිසියම් ශිෂ්‍යයෙකුගේ හැසිරීම විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වාගෙන යෑමට හෝ සාමය ආරක්ෂා කිරීමට බාධාවක් වේ යැයි හැඟී ගිය විට හෝ විශ්වවිද්‍යාලය භූමියේ ශාලාවක, පුස්තකාලයේ කාමරයක හෝ විද්‍යාගාරයක නීත්‍යානුකූලව පැවැත්වෙන කාර්යයකට බාධාවක් වේ යැයි හැඟී ගිය විට එම ශිෂ්‍යයා විශ්වවිද්‍යාල භූමියෙන්, දේශන ශාලාවෙන්, පුස්තකාලයෙන්, විද්‍යාගාරයෙන් හෝ විශ්වවිද්‍යාලය තුළ කවර හෝ ස්ථානයකින් වුව ද ඉවත් කිරීම (විශ්වවිද්‍යාල භූමියෙන් පිටවීමට නියම කළ හොත් ඒ ගැන විස්තර වාර්තාවක් පැය 24ක් ඇතුළත මහෝපාධ්‍යායයන් වහන්සේට ඉදිරිපත් කළ යුතුය).

ii. කවර ශිෂ්‍යයෙකුට හෝ තමාගේ අනන්‍යතා පත්‍රය හෝ ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කරන ලෙස නියෝග කිරීම.

iii. ශිෂ්‍යයෙකුගේ කිසියම් විනය විරෝධී හෝ විෂමාචාර ක්‍රියාවක් ගැන දැනගත් විට ඒ ශිෂ්‍යයාට තම කාර්යාලයට පැමිණෙන ලෙස දැන්වීම හා ඔහුගෙන් වාචික හෝ ලිඛිත වාර්තාවක් හෝ කට උත්තරයක් ලබාගැනීම.

iv. ශිෂ්‍යයෙකුගේ විනය විරෝධී හෝ විෂමාචාර ක්‍රියා ගැන විනය බලධාරීන් මගින් මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත වාර්තා කිරීම.